පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
ஆட்களை பதிவு செய்யும் திணைக்களம்
**Department for Registration of Persons**

# කාර්ය සාධන වාර්තාව-2015
# செயல் மதிப்பீட்டு அறிக்கை-2015
# PERFORMANCE REPORT-2015



සී-45, කැප්පෙටිපොල පාර, කොළඹ 05.
சி-45, கெப்பெட்டிபொல மாவத்தை, கொழும்பு-05.
C-45, Keppetipola Road, Colombo 05.

# කාර්ය සාධන වාර්තාව
# 2015

පටුන

| | | |
|---|---|---|
| **1.** | හැඳින්වීම | 1 |
| | තේමාව | 1 |
| | දැක්ම | 1 |
| | මෙහෙවර | 1 |
| | ප්‍රධාන කාර්ය භාරය | 1 |
| | දෙපාර්තමේන්තුවේ වගකීම් | 1 |
| **2.** | හැඳුනුම්පත් නිකුත් කිරීම | 2 |
| | සාමාන්‍ය සේවය | 2 |
| | එක්දින සේවය | 3 |
| | අයදුම්පත් ලැබීම හා හැඳුනුම්පත් නිකුත් කිරීම | 4 |
| **3.** | ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමේ වැඩ සටහන | 5-6 |
| **4.** | හැඳුනුම්පත් නිකුත් කිරීමේ ක්‍රියාවලිය සඳහා තොරතුරු තාක්ෂණය යොදා ගැනීම | 7 |
| **5.** | ජංගම සේවය | 7 |
| **6.** | පුහුණු කිරීමේ කටයුතු | 7 |
| **7.** | දිරි දීමනා ගෙවීම | 7 |
| **8.** | නීතිමය කටයුතු | 7 |
| **9.** | භෞතික සම්පත් කළමනාකරණය | 8 |
| **10.** | මූල්‍ය ප්‍රගතිය | 9 |
| **11.** | කාර්ය මණ්ඩල විස්තර | 10-11 |
| **12.** | **e-NIC** ව්‍යාපෘතිය | 12-21 |

# පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
# කාර්ය සාධන වාර්තාව
# 2015 වසර

## 1. හැඳින්වීම

1968 අංක 32 දරණ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධාන අනුව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් 1972 වර්ෂයේ සිට වයස අවුරුදු 18 ඉක්මවූ ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූල පදිංචිකරුවන් ලියාපදිංචි කිරීම හා හැඳුනුම්පත් නිකුත් කිරීම ආරම්භ කරන ලද අතර එම පනතට කරන ලද සංශෝධනයනට අනුව 1981 වසරේ සිට පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ වයස් සීමාව අවුරුදු 16 ලෙස නම් කරන ලදි.

***තේමාව***

- විශ්වසනීය පුද්ගල අනන්‍යතාවය ජාතික හැඳුනුම්පතයි

***දැක්ම***

- සෑම ශ්‍රී ලාංකික පුරවැසියකුටම තහවුරු කරන ලද අනන්‍යතාවක්

***මෙහෙවර***

- සිය දේශය තුළදී සියලුම ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ මානව, සමාජ, ආර්ථික, දේශපාලනික සහ නීතිමය අයිතිවාසිකම් සුරකෙන අයුරින්ද, සිය දේශයෙන් බැහැර වූ අවස්ථාවල ආරක්ෂාව සැලසෙන අයුරින්ද, ඔවුන්ගේ තොරතුරු ඇතුළත් කොට ජාතික පුද්ගල දත්ත පද්ධතියක් සකස් කිරීම, කිසියම් පුරවැසියකුගේ අනන්‍යතාවය තහවුරු කර ගත යුතු අවස්ථාවල දී ජාතික හා අනෙකුත් ආයතන වලට තොරතුරු සැපයීම සහ ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාවට හා සංවර්ධනයට සහයවීම

***ප්‍රධාන කාර්යභාරය***

- සෑම ශ්‍රී ලාංකික පුරවැසියකුගේම පුද්ගල තොරතුරු රැස්කර ජාතික පුද්ගල තොරතුරු පද්ධතියක් ස්ථාපිත කර පවත්වාගෙන යාම

- සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ට ජාතික හැඳුනුම්පතක් නිකුත් කිරීම

- ජාතික බුද්ධි හා ආරක්ෂක අංශ වලට අවශ්‍ය වූ විට පුද්ගලයන් පිළිබඳ තොරතුරු විමර්ශණය කිරීම, සහතික කිරීම සහ තොරතුරු හා දැනුම හුවමාරු කර ගැනීම

***දෙපාර්තමේන්තුවේ වගකීම***

- සෑම ශ්‍රී ලාංකික පුරවැසියකුගේම පුද්ගල තොරතුරු රැස්කර ජාතික පුද්ගල දත්ත ගබඩාවක් ස්ථාපිත කර පවත්වාගෙන යාම

- නිසි වයස සම්පූර්ණ වූ සෑම ශ්‍රී ලාංකික පුරවැසියකුම ලියාපදිංචි කර ජාතික හැඳුනුම්පතක් නිකුත් කිරීම

- ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ පුද්ගල තොරතුරු තහවුරු කර සහතික කිරීම

- රාජ්‍ය හා අනිකුත් ආයතන සමඟ තොරතුරු හා දැනුම හුවමාරු කර ගැනීම

- නූතන තාක්ෂණික දැනුම හා මානව සම්පත් සංවර්ධනය තුළින් දෙපාර්තමේන්තුවේ ශක්‍යතාවය ගොඩනැගීම

- ජාතික ආරක්ෂාවට හා රටේ සංවර්ධන ක්‍රියාවලියට සහායවීම


## 2. හැඳුනුම්පත් නිකුත් කිරීම.

- **සාමාන්‍ය සේවය**

2015 වර්ෂයේ ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ සාමාන්‍ය සේවය යටතේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ හැඳුනුම්පත් ගණන පහත පරිදි වේ.

| **මාසය** | **ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව** | **නිකුත් කළ හැඳුනුම්පත් සංඛ්‍යාව** |
|---|---|---|
| ජනවාරි | 46,190 | 67,667 |
| පෙබරවාරි | 50,763 | 64,816 |
| මාර්තු | 69,250 | 72,095 |
| අප්‍රේල් | 72,029 | 47,244 |
| මැයි | 89,194 | 50,677 |
| ජූනි | 94,842 | 62,755 |
| ජූලි | 107,740 | 52,082 |
| අගෝස්තු | 80,136 | 84,968 |
| සැප්තැම්බර් | 56,862 | 119,950 |
| ඔක්තෝම්බර් | 50,560 | 68,195 |
| නොවැම්බර් | 40,546 | 93,073 |
| දෙසැම්බර් | 39,316 | 49,593 |
| **එකතුව** | **797,428** | **833,115** |

ඉහත වගුවේ ආකාරයට අයදුම්පත් ලැබීම හා හැඳුනුම්පත් නිකුත් කිරීම අතර වෙනස නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද හා අවලංගු කරන ලද අයදුම්පත් වේ.





සැ.යු. : සමහර මාස වල ලැබුණු අයදුම්පත් සංඛ්‍යාවට වඩා නිකුත් කළ හැඳුනුම්පත් සංඛ්‍යාව අඩු වී ඇත්තේ නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් සඳහා හැඳුනුම්පත් සකස් කිරීමට නොහැකිවීම නිසාය. අනෙකුත් මාස වලදී එම අයදුම්පත් වල අඩුපාඩු සම්පූර්ණ වීම මත හැඳුනුම්පත් සකස් කිරීම හේතුවෙන් එම මාස වල ලද අයදුම්පත් සංඛ්‍යාවට වඩා නිකුත් කළ හැඳුනුම්පත් සංඛ්‍යාවක් වැඩි වී ඇත.

- **එක් දින සේවය**

හදිසි අවශතාවයන් සඳහා කඩිනමින් හැඳුනුම්පත් ලබා ගැනීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් වෙනුවෙන් එක් දිනක් තුළ හැඳුනුම්පත් නිකුත් කිරීමේ කඩිනම් වැඩපිළිවෙලක් (එක් දින සේවය) 2003.09.01 දින සිට ආරම්භ කර ඇත. මේ යටතේ එක් අයදුම්පතක් වෙනුවෙන් රු.500/- ක රජයේ අනුමත ගාස්තුවක් අය කරනු ලැබූ අතර 2015 ජූලි 01 දින සිට එක් දින සේවා ගාස්තුව රු.1000/- ක් ලෙස සංශෝධනය කරනු ලැබ ඇත.


එක් දින සේවා වැඩ සටහන යටතේ 2015 වර්ෂයේ ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා එක් එක් මාසය තුළ නිකුත් කරනු ලැබූ හැඳුනුම්පත් සංඛ්‍යාව සහ ඉන් දෙපාර්තමේන්තුව ලැබූ ආදායම පහත වගුවෙන් දැක්වේ.

| මාසය | නිකුත් කළ හැඳුනුම්පත් සංඛ්‍යාව | ලද ආදායම (රු) |
|---|---|---|
| ජනවාරි | **14,946** | **7,473,000.00** |
| පෙබරවාරි | **17,262** | **8,631,000.00** |
| මාර්තු | **18,540** | **9,270,000.00** |
| අප්‍රේල් | **12,049** | **6,024,500.00** |
| මැයි | **15,811** | **7,905,500.00** |
| ජූනි | **22,274** | **11,137,000.00** |
| ජූලි | **20,941** | **20,941,000.00** |
| අගෝස්තු | **19,321** | **19,321,000.00** |
| සැප්තැම්බර් | **16,904** | **16,904,000.00** |
| ඔක්තෝම්බර් | **17,268** | **17,268,000.00** |
| නොවැම්බර් | **16,974** | **16,974,000.00** |
| දෙසැම්බර් | **16,584** | **16,584,000.00** |
| එකතුව | **208,874** | **158,433,000.00** |



- **අයදුම්පත් ලැබීම හා හැඳුනුම්පත් නිකුත් කිරීම**

| වර්ෂය | ලද අයදුම්පත් සංඛ්‍යාව | නිකුත් කළ හැඳුනුම්පත් සංඛ්‍යාව | වර්ෂය | ලද අයදුම්පත් සංඛ්‍යාව | නිකුත් කළ හැඳුනුම්පත් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1972 | 1,305,801 | 22,459 | 1994 | 545,121 | 493,093 |
| 1973 | 5,570,696 | 680,024 | 1995 | 907,560 | 616,915 |
| 1974 | 619,855 | 5,071,234 | 1996 | 816,275 | 853,191 |
| 1975 | 72,268 | 248,694 | 1997 | 782,988 | 636,187 |
| 1976 | 138,216 | 246,694 | 1998 | 771,597 | 655,580 |
| 1977 | 152,221 | 221,783 | 1999 | 731,079 | 753,560 |
| 1978 | 236,834 | 423,276 | 2000 | 758,463 | 651,787 |
| 1979 | 186,813 | 194,436 | 2001 | 711,295 | 679,250 |
| 1980 | 360,510 | 297,702 | 2002 | 794,357 | 700,000 |
| 1981 | 479,724 | 474,577 | 2003 | 633,168 | 635,046 |
| 1982 | 425,904 | 505,559 | 2004 | 607,111 | 524,241 |
| 1983 | 358,830 | 342,088 | 2005 | 731,310 | 564,872 |
| 1984 | 451,651 | 421,010 | 2006 | 1,196,276 | 897,674 |
| 1985 | 446,619 | 458,557 | 2007 | 1,086,236 | 958,445 |
| 1986 | 364,150 | 374,074 | 2008 | 933,663 | 818,407 |
| 1987 | 372,108 | 353,819 | 2009 | 986,670 | 941,537 |
| 1988 | 431,102 | 409,870 | 2010 | 899,349 | 890,084 |
| 1989 | 365,966 | 333,083 | 2011 | 752,399 | 835,548 |
| 1990 | 491,622 | 397,135 | 2012 | 900,751 | 781,922 |
| 1991 | 676,681 | 646,150 | 2013 | 1,048,343 | 969,617 |
| 1992 | 568,493 | 545,957 | 2014 | 957,382 | 881,721 |
| 1993 | 528,628 | 468,494 | 2015 | 1,006,302 | 1,041,989 |
| | | | **මුලු එකතුව** | **33,162,387** | **28,958,896** |



## 3. ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමේ වැඩසටහන්

- **සිංහල හා දෙමළ භාෂා දෙකෙන් යුතුව මුද්‍රණය කරන ලද පරිගණකගත හැඳුනුම්පතක් හඳුන්වා දීම**

සිංහල හා දෙමළ භාෂා ද්විත්වයෙන් හැඳුනුම්පත් ලියා නිකුත් කරන ලෙස ඉල්ලා ඉදිරිපත් කර තිබූ අංක SC Application No.93/2013(F/R) දරණ මානව හිමිකම් පෙත්සම් විභාගය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින්, විද්‍යුත් ජාතික හැඳුනුම්පත නිකුත් කරන තෙක්, 2014.01.01 දින සිට සිංහල හා දෙමළ භාෂා ද්විත්වයෙන් යුතුව හැඳුනුම්පත් නිකුත් කරන ලෙස නියෝග කර ඇත.

එතෙක් නිකුත් කරන ලද හැඳුනුම්පත අතින් ලියා එක් භාෂාවකින් පමණක් නිකුත් කරන ලද්දකි. හැඳුනුම්පත භාෂා දෙකකින් අතින් ලිවීමේ දී ඒ සඳහා ගත වන කාලය පෙර එක් භාෂාවකින් පමණක් අතින් ලිවීම සඳහා ගත වන කාලය මෙන් දෙගුණයක් පමණ ගතවනු ඇත. එසේම ඒ සඳහා අවශ්‍ය වන නිලධාරීන් සංඛ්‍යාවද අති විශාලය. මේ සඳහා විසඳුමක් ලෙස තොරතුරු තාක්ෂණය උපයෝගී කර ගනිමින් සිංහල හා දෙමළ භාෂා දෙකෙන් යුතුව මුද්‍රණය කරන ලද හැඳුනුම්පතක් 2014.02.28 වන දින සිට නිකුත් කිරීම ආරම්භ කරන ලදි.

- **තාවකාලික ලිපිකරුවන් (දෙමළ භාෂා) බඳවා ගැනීම**

ජාතික හැඳුනුම්පත් සැකසීම සඳහා විශේෂයෙන් බඳවා ගෙන ඇති දෙපාර්තමේන්තු සේවකයින් වන නිෂ්පාදන සහායකයන් අතුරින් දෙමළ බසින් කටයුතු කිරීමට හැකි සේවකයන්ගේ හිඟය නිසා දෙමළ බසින් හැඳුනුම්පත් නිකුත් කිරීමේ පසුබෑමක් ඇති වී තිබුණි.

මේ සම්බන්ධව ව්‍යවස්ථා කටයුතු හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය වෙත සිදු කරන ලද ඉල්ලීමක් අනුව එම අමාත්‍යාංශය මගින් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) ආධාර යටතේ ක්‍රියාත්මක වූ "යුක්තිදාමයට සම ප්‍රවේශත්ව" (Equal Access to Justice) ව්‍යාපෘතිය යටතේ පුහුණුව ලැබූ 16 දෙනෙකු ආරම්භයේදී රු 9000/- ක මාසික දීමනාවක් ලබා දීමේ පදනම මත තාවකාලික ලිපිකරු (දෙමළ භාෂා) වශයෙන් බඳවා ගන්නා ලදී. එම නිලධාරීන් පහත පරිදි සේවයේ යොදවා ගන්නා ලදි. මේ සඳහා ප්‍රතිපාදන ඉහත ව්‍යාපෘතිය යටතේ ලබා දෙන ලදී.

| කාල සීමාව | ලිපිකරුවන් ගණන | ගෙවීම් පදනම |
|---|---|---|
| 2009.08.07 – 2009.11.06 | 16 | රු 9000/- ක මාසික දීමනාවක් |
| 2009.11.16 – 2010.03.15 | 16 | |
| 2010.04.15 – 2010.08.31 | 23 | රු 10000/- ක මාසික දීමනාවක් |
| 2010.09.15 – 2011.02.14 | 07 | රු 15000/- ක මාසික දීමනාවක් |
| 2010.10.04 – 2011.02.14 | 23 | |
| 2011.08.01 – 2011.12.31 | 07 | |
| 2012.01.04 – 2012.05.31 | 07 | |
| 2012.06.06 – 2012.07.31 | 07 | |
| 2012.08.01 – 2012.12.31 | 07 | |
| 2013.04.08 – 2013.07.31 | 05 | |
| 2013.08.07 – 2013.12.31 | 07 | |
| 2014.05.16 – 2014.09.16 | 07 | |
| 2014.07.14 – 2014.09.16 | 01 | |
| 2014.11.01 – 2014.11.19 | 08 | |

- **කොන්ත්‍රාත් පදනම මත දෙමළ භාෂා ලිපිකරුවන් සේවයේ යෙදවීම**

2014.02.28 දිනැතිව ආරම්භ කරන ලද සිංහල හා දෙමළ ද්වි භාෂාවෙන් හැඳුනුම්පත් නිකුත් කිරීමේ නව පරිගණකගත ක්‍රමවේදය අනුව සියළුම හැඳුනුම්පත් දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම අත්‍යාවශ්‍ය කරුණකි. ඒ සඳහා දෙපාර්තමේන්තුවට අනුයුක්තව ඇති දෙමළ භාෂාවෙන් කටයුතු කළ හැකි නිලධාරීන්ගේ හිඟතාවය හේතුවෙන් දෙමළ භාෂා ලිපිකරුවන් 10 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමැතිය ලබා දෙන ලදි. ඒ අනුව පහත පරිදි කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් සේවයේ යොදවා ගනු ලැබ ඇත.

| කාල සීමාව | ලිපිකරුවන් ගණන | ගෙවීම් පදනම |
|---|---|---|
| 2014.11.21 - 2015.11.20 | 8 | රු.437/- ක දෛනික වැටුප් මත |
| 2015.01.16 - 2016.01.15 | 2 | රු.437/- ක දෛනික වැටුප් මත |
| 2015.11.21 - 2016.11.20 | 8 | රු.437/- ක දෛනික වැටුප් මත |

- **සිවිල් ආරක්ෂක නිලධාරීන් සේවයේ යෙදවීම**

ජාතික හැඳුනුම්පත් සකස් කිරීමේ ක්‍රියාවලියට සෘජුව දායක වන නිෂ්පාදන සහායක කාණ්ඩයේ නිළධාරීන් උසස් වීම් ලබා වෙනත් සේවා වලට යාම හේතුවෙන් හැඳුනුම්පත් සකස් කිරීම සඳහා යොදවා ගත හැකි නිලධාරීන් සීමා විය. එම නිසා සිවිල් ආරක්ෂක නිලධාරීන් 47 දෙනෙකු 2010.09.20 දින සිට 2013 වසර දක්වා මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදවා ඇත. 2014 වර්ෂයේ ජනවාරි මාසයේ සිට එම නිලධාරීන් 16 දෙනෙකු සේවයේ යොදවා ගන්නා ලදි. 2015 වසරේ කළමනාකරණ සහකාර සේවයේ නවක නිලධාරීන් මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්ත කිරිමත් සමග 2015.10.13 දින සිට සිවිල් ආරක්ෂක නිලධාරින්ගේ සේවය ලබා ගැනීම නවතා ඇත.

- **ප්‍රායෝගික පුහුණු සිසු සිසුවියන් බඳවා ගැනීම**

ඉහත නිලධාරීන්ට අමතරව වෘත්තීය පුහුණු ආයතන වල අධ්‍යාපනය ලත් සිසු සිසුවියන් පහත පරිදි දිනකට රු 500/= ක දීමනාවක් යටතේ සේවයට යොදවාගෙන ඇත.

| කාල සීමාව | සිසු සිසුවියන් ගණන | වෘත්තීය පුහුණු ආයතනය |
|---|---|---|
| 2011.08.10 – 2012.02.09 | 6 | ජාතික තරුණ සේවා සභාව |
| 2011.08.15 – 2012.02.14 | 4 | ලලිත් ඇතුලත්මුදලි වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය |
| 2011.12.08 – 2012.06.07 | 1 | දෙහිවල වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය |
| 2012.04.02 – 2012.10.01 | 4 | ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය |
| 2012.04.20 – 2012.10.19 | 1 | ගම්පහ කාර්මික විද්‍යාලය |
| 2012.10.01 – 2013.03.31 | 2 | ශ්‍රී ලංකා කොරියානු ජාතික තාක්ෂණික විද්‍යාලය |
| 2012.12.10 – 2013.06.09 | 1 | ගම්පහ කාර්මික විද්‍යාලය |
| 2013.01.21 – 2013.07.20 | 2 | ලලිත් ඇතුලත්මුදලි වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය |
| 2014.07.07 – 2015.01.06 | 1 | ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය |
| 2014.07.15 – 2015.01.14 | 1 | ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය |
| 2014.02.18 – 2014.07.04 | 1 | උසස් තාක්ෂණ ආයතනය - දෙහිවල |
| 2014.02.18 – 2014.08.17 | 2 | උසස් තාක්ෂණ ආයතනය - දෙහිවල |
| 2014.04.28 – 2014.10.27 | 1 | යෞවන කටයුතු සහ නිපුනතා සංවර්ධන අමාත්‍යාංශය |
| 2014.05.20 – 2014.11.19 | 4 | යෞවන කටයුතු සහ නිපුනතා සංවර්ධන අමාත්‍යාංශය |
| 2014.07.07 – 2015.01.06 | 1 | ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය |
| 2014.07.15 – 2015.01.14 | 1 | ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය |

## 4. හැඳුනුම්පත් නිකුත් කිරීමේ ක්‍රියාවලිය සඳහා තොරතුරු තාක්ෂණය යොදා ගැනීම

- **පරිගණක අනුසාරයෙන් අංක යෙදීම**

මුල් වරට නිකුත් කරනු ලබන හැඳුනුම්පත් සඳහා අංක යෙදීම 2007 ජනවාරි 01 වන දින සිට දෙපාර්තමේන්තුව තුළම සිදු කිරීම ආරම්භ කරන ලදී.

- **පරිගණක භාවිතයෙන් හැඳුනුම්පත සකස් කිරීම**

පරිගණකය භාවිතයෙන් සිංහල සහ දෙමළ ද්වි භාෂාවෙන්ම මුද්‍රිත හැඳුනුම්පත් නිකුත් කිරීමේ ක්‍රමවේදය 2014 පෙබරවාරි මස 28 දින සිට ආරම්භ කරන ලදී.

- **පරිගණක සුචිපත් නිකුත් කිරීම**

නැතිවූ හැඳුනුම්පත් සඳහා අනුපිටපත් නිකුත් කිරීමේ දී සහ පවත්නා හැඳුනුම්පත් සංශෝධනය කිරිමේදී අවශ්‍ය වන දෙපාර්තමේන්තු වාර්තා (සුචිපත්) සෙවීම අතින් සිදු කෙරෙන කාර්යයක් විය. දැනට එම සුචි පත් පරිගණක ගත කර ඇති බැවින් ඒවා පරිගණකය මගින් පරීක්ෂා කිරීම සිදු වේ.

## 5. ජංගම සේවය

ඡන්ද ප්‍රකාශ කිරීම සඳහා ජාතික හැඳුනුම්පත අනිවාර්ය කිරීමත් සමග ජංගම සේවා පැවැත්වීම වේගවත් කරන ලදි. මෙම ජංගම සේවා මගින් දුර බැහැර ප්‍රදේශ වල සිටින ජනතාව වෙත ගොස් සම්පූර්ණ කරන ලද අයදුම්පත් භාර ගැනීම සිදු කරනු ලබයි. ස්ථානීය මට්ටමින් ක්‍රියාත්මක කරන ලද ජංගම සේවා වැඩසටහන් යටතේ 2015 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා හැඳුනුම්පත් 18,747ක් නිකුත් කර ඇත.

## 6. පුහුණු කිරීමේ කටයුතු

මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ ඵලදායීතාවය වර්ධනය කිරීමේ අරමුණින් ඔවුන් 2015 වර්ෂය පුරා විවිධ පුහුණු පාඨමාලා සඳහා සහභාගි කරවන ලදි. එමගින් දෙපාර්තමේන්තුවේ කාර්යයන් කාර්යක්ෂමව ඉටු කරවා ගැනීම හා මහජනතාවට කඩිනමින් සේවයක් ලබා දීම අපේක්ෂා කෙරේ.

2015 වර්ෂය තුල දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පුහුණු කිරීම් සම්බන්ධ විස්තර ඇමුණුම් අංක (I) හි සඳහන් වේ.

## 7. දිරි දීමනා ගෙවීම

2003 වර්ෂයේ සිට අයදුම්කරුවන්ගේ ඉල්ලීම් මත එක් දිනක් තුලදී හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා එක් දින සේවය ආරම්භ කර ඇත.

මෙම එක් දින සේවා කාර්ය මණ්ඩලය සඳහා විධිමත් අනුමැතිය සහිතව දිරි දීමනා ක්‍රමයක් ක්‍රියාත්මක වේ. 2015 වර්ෂය තුළදීද මෙම දිරි දීමනා ක්‍රමය ක්‍රියාත්මක කර ඇත.

## 8. නීතිමය කටයුතු

ගැටළු සහිත අයදුම්පත් ඉදිරිපත් කිරීම, සැක සහිත අයදුම්පත් අංක තහවුරු කිරීම, විවිධ රාජ්‍ය හා පෞද්ගලික ආයතන මගින් කරන ලද විමසීම් වලට පිළිතුරු සැපයීම, සැක කටයුතු උප්පැන්න පරීක්ෂා කිරීම සහ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත උල්ලංඝනය කිරීම් වලට දඩ අය කිරීම ආදී වශයෙන් 2015 වසර තුළ ඉටු කරන ලද කාර්යයන් පිළිබඳ විස්තර ඇමුණුම් අංක (II) හි සඳහන් වේ.

## 9. භෞතික සම්පත් කළමනාකරණය

- **ඉඩම් හා ගොඩනැගිලි**

අංක 45, කැප්පෙටිපොල පාර, කොළඹ 05 දරණ ස්ථානයෙහි පිහිටි ගොඩනැගිල්ල දෙපාර්තමේන්තුව සතුය.

- **කුළියට ගැනීම්**

දෙපාර්තමේන්තුව අයදුම්පත් ගබඩා කිරීම සඳහා නුගේගොඩ පිහිටි වර්ග අඩි 12,180ක වපසරියකින් යුත් "යමුනා ගොඩනැගිල්ල", සියලු බදු මුදල් සහිතව රු.527,250/- ක මාසික කුළියට ලබා ගෙන ඇත.

- **අනෙකුත් වත්කම්**

දැනට දෙපාර්තමේන්තුව සතුව ඇති වාහන පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | අංකය | වාහනය | වර්ගය | මිලදී ගත් දිනය | මිල දී ගත් වටිනාකම (රු) |
|---|---|---|---|---|---|
| 1 | NA 2147 | වෑන් රථය | මිට්සුබිෂි L300 | 2006.05.24 | 4,450,000.00 |
| 2 | KB 8577 | මෝටර් කාර් රථය | නිසාන් සනී සුපර් සැලූන් | 2006.05.23 | 3,400,000.00 |
| 3 | PA 9855 | L 300 වෑන් රථය | මිට්සුබිෂි L300 | 2006.11.22 | 4,250,000.00 |
| 4 | PB 6775 | L 300 වෑන් රථය | මිට්සුබිෂි L300 | 2008.08.11 | 6,250,000.00 |
| 5 | PC 3265 | කැබ් රථය | මහේන්ද්‍රා බොලෙරෝ | 2011.06.28 | 2,627,353.00 |
| 6 | KP 5832 | ජීප් රථය | මහේන්ද්‍රා ස්කෝපියෝ | 2011.08.18 | 4,587,528.00 |
| 7 | WP 6059 | යතුරු පැදිය | ටීවීඑස් - ස්ටාර් ස්පෝර්ට් | 2011.06.14 | 104,496.00 |
| 8 | PE 1266 | කැබ් රථය | ටොයෝටා හයිලක්ස් | 2012.06.13 | 7,500,000.00 |
| 9 | KX 7866 | මෝටර් කාර් රථය | නිසාන් සිල්ෆි | 2014.01.19 | 9,390,000.00 |
| 10 | PF7780 | කැබ් රථය | මිට්සුබිෂි L200 | 2014.12.18 | 6,390,000.00 |
| 11 | CAN6891 | මෝටර් කාර් රථය | නිසාන් සනී N17 | 2015.12.08 | 5,795,000.00 |
| 12 | CAN7833 | මෝටර් කාර් රථය | නිසාන් සනී N17 | 2015.12.10 | 5,795,000.00 |

## 10. මූල්‍ය ප්‍රගතිය

- **2015 වර්ෂය සඳහා වියදම් ඇස්තමේන්තුව හා වියදම් පහත පරිදි වේ.**

| අංකය | | ක්‍රියාකාරකම් | වියදම් ඇස්තමේන්තුව 2015 (රු. දහස්) | ප්‍රගතිය (රු. දහස්) 2015.12.31 | |
|---|---|---|---|---|---|
| | | **පුනරාවර්ථන වියදම්** | | | |
| 1 | | පුද්ගල පඩිනඩි | 507,845 | මූල්‍ය | 505,098 |
| | | | | භෞතික | |
| 2 | | වෙනත් පුනරාවර්ථන වියදම් | 63,394 | මූල්‍ය | 61,832 |
| | | | | භෞතික | |
| | | **පුනරාවර්ථන වියදම් එකතුව** | **571,239** | | **566,930** |
| | | **ප්‍රාග්ධන වියදම්** | | | |
| | | **මූලධන වත්කම්වල පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම** | | | |
| 3 | 2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 3,500 | මූල්‍ය | 1,276 |
| | | | | භෞතික | 3 |
| 4 | 2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 500 | මූල්‍ය | 381 |
| | | | | භෞතික | 9 |
| 5 | 2003 | වාහන | 500 | මූල්‍ය | 485 |
| | | | | භෞතික | 6 |
| | | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | | | |
| 6 | 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 5,300 | මූල්‍ය | 5,212 |
| | | | | භෞතික | 91 |
| 7 | 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 2,341 | මූල්‍ය | 2,340 |
| | | | | භෞතික | 20 |
| | | **මානව සම්පත් සංවර්ධනය** | | | |
| 8 | 2401 | කාර්ය මණ්ඩල පුහුණු(අ) | 1,200 | මූල්‍ය | 1,194 |
| | | | | භෞතික | 37 |
| | | **වෙනත් මූලධන වියදම්** | | | |
| 9 | 2502 | ආයෝජන | 90,000 | මූල්‍ය | 89,977 |
| | | | | භෞතික | |
| | | **ප්‍රාග්ධන වියදම් එකතුව** | **103,341** | මූල්‍ය | **100,865** |
| | | | | භෞතික | |
| | | **මුළු එකතුව** | **674,580** | මූල්‍ය | **667,795** |

- **2015 වර්ෂය සඳහා ආදායම් ඇස්තමේන්තුව හා ආදායම් පහත පරිදි වේ.**

| ක්‍රියාකාරකම් | ආදායම් ඇස්තමේන්තුව 2015 (රු:) | ප්‍රගතිය 2015.12.31(රු:) |
|---|---|---|
| එක් දින සේවා ආදායම | 105,000,000 | 158,433,000 |
| දඩ මුදල්/ ගාස්තු | 200,000 | 2,107,800 |
| මුද්දර ආදායම | 10,200,000 | 10,633,983 |
| **එකතුව** | **115,400,000** | **171,174,783** |

## 11. කාර්ය මණ්ඩල තොරතුරු

**කාර්ය මණ්ඩලයේ නව පත්වීම්, විශ්‍රාම ගැනීම්, ඉල්ලා අස්වීම්, ස්ථාන මාරුවීම්, මුදාහැරීම් සහ උසස්වීම් ලද නිලධාරී සංඛ්‍යාව පහත පරිදි වේ.**

### I. නව පත්වීම්

- ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් 06 දෙනෙකු
- සංවර්ධන නිලධාරි සේවයේ නිලධාරින් 16 දෙනෙකු
- රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් 33 දෙනෙකු
- කාර්යාල කාර්ය සහායක සේවයේ නිලධාරීන් 27 දෙනෙකු

### II. විශ්‍රාම ගැනීම්

- ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 01ක් නිලධාරියකු
- රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් 05 දෙනෙකු
- කාර්යාල කාර්ය සහායක සේවයේ 01ක් නිලධාරියකු

### III. ඉල්ලා අස්වීම්

- සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරින් 02ක්
- නිෂ්පාදන සහයක 01ක් නිලධාරියකු

### IV. ස්ථාන මාරුවීම්

- ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් 06 දෙනෙකු ස්ථාන මාරුව පැමිණි අතර නිලධාරීන් 05 දෙනෙකු ස්ථාන මාරු ලැබ ගොස් ඇත.
- ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ 01ක් නිලධාරියකු ස්ථාන මාරු වී පැමිණ ඇත.
- රාජය කළමනාකරණ සහකාර සේවයේ අධිශ්‍රේණියේ නිලධාරින් 02 ක් ස්ථාන මාරුව පැමිණි අතර, 01ක් නිලධාරියකු ස්ථාන මාරු ලැබ ගොස් ඇත.
- රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් 14 දෙනෙකු ස්ථාන මාරුව පැමිණි අතර නිලධාරීන් 25 දෙනෙකු ස්ථාන මාරු ලැබ ගොස් ඇත.
- සංවර්ධන නිලධාරි සේවයේ නිලධාරීන් 27 දෙනෙකු ස්ථාන මාරුව පැමිණි අතර නිලධාරීන් 27 දෙනෙකු ස්ථාන මාරු ලැබ ගොස් ඇත.
- රියදුරු සේවයේ නිලධාරීන් හය දෙනෙකු ස්ථාන මාරුව පැමිණි අතර නිලධාරීන් දෙදෙනෙකු ස්ථාන මාරු ලැබ ගොස් ඇත.
- කාර්යාල කාර්ය සහයක සේවයේ නිලධාරීන් 12 දෙනෙකු ස්ථාන මාරුව පැමිණි අතර නිලධාරීන් 09 දෙනෙකු ස්ථාන මාරු ලැබ ගොස් ඇත.

### V. මුදා හැරීම්

- රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් 04 දෙනෙකු
- බලාත්මක නිලධාරීන් 01 අයකු
- සංවර්ධන නිලධාරි සේවයේ නිලධාරීන් 12 දෙනෙකු
- කාර්යාල කාර්ය සහයක සේවයේ 01ක් නිලධාරියකු

## VI. උසස් වීම්

- ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරියෙකු I ශ්‍රේණියට උසස්වීම් ලබා ඇත.
- රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II පන්තියේ එක් නිලධාරිනියක ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පත්වීමක් ලබා ඇත.
- රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II පන්තියේ නිලධාරීන් 04 දෙනෙකු I පන්තියට උසස්වීම් ලබා ඇත.
- රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III පන්තියේ එක් නිලධාරියකු II පන්තියට උසස්වීම් ලබා ඇත.
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ නිලධාරින් 3 දෙනෙකු 3 පන්තියේ III ශ්‍රේණියේ සිට 3 පන්තියේ II ශ්‍රේණියට උසස්වීම් ලබා ඇත.
- කාර්යාල සේවක සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් 3 දෙනෙකු විශේෂ ශ්‍රේණියට උසස්වීම් ලබා ඇත.
- කාර්යාල සේවක සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් දෙදෙනෙකු I ශ්‍රේණියට උසස්වීම් ලබා ඇත.

දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල විස්තරය ඇමුණුම III හි දක්වා ඇත.

## 12. e-NIC ව්‍යාපෘතිය

### 1. ව්‍යාපෘතියේ අරමුණු / පරමාර්ථ

- වයස අවුරුදු 15 හා ඊට වැඩි පුරවැසියන්ගේ තොරතුරු, ජීව මිතික දත්ත ඇතුළත් ජාතික පුරවැසි දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම.
- දැනට භාවිත කරනු ලබන ජාතික හැඳුනුම්පත වෙනුවට පුද්ගල අනන්‍යතාවට වඩාත් හොඳින් තහවුරු වන සේ විද්‍යුත් ජාතික හැඳුනුම්පතක් නිකුත් කිරීම.
- රාජ්‍ය හා අනෙකුත් ආයතන සමග තොරතුරු හුවමාරුකර ගැනීමේ හා තොරතුරු සත්‍යාපනය කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම.
- ජාතික ආරක්ෂාවට සහ රටේ සංවර්ධන ක්‍රියාවලියට අවශ්‍ය පහසුකම් සැපයීම.

### 2. ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්යභාරයන්

- ජාතික පුරවැසි තොරතුරු පද්ධතිය සකස්කිරීම හා විද්‍යුත් ජාතික හැඳුනුම්පත නිකුත්කිරීමට අදාලව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත සංශෝධනය කිරීම හා ඊට අදාල රෙගුලාසි සකස් කිරීම.
- ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු ප්‍රතිව්‍යුහගත කිරීම.
- දත්ත එකතු කිරීමේ කටයුතු සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ශාඛා කාර්යාල මෙහෙයුම් මධ්‍යස්ථාන ලෙස ස්ථාපිත කිරිම සහ අවශ්‍ය යටිතල පහසුකම් සකස්කිරීම.
- පවතින හැඳුනුම්පත නව අකෘතියකට අනුව ප්ලාස්ටික් කාඩ්පතක නිකුත් කිරීම.
- බත්තරමුල්ලේ පිහිටි SPI ගොඩනැගිල්ල තුල පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය හා විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතියේ මෙහෙයුම් ඒකකය ස්ථාපිත කිරීම.
- තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- දත්ත රැස් කිරීමේ වැඩසටහන ( Data Capturing Programme) ක්‍රියාත්මක කිරීම.
- දත්ත විද්‍යුත්කරණය( Data Digitizing) කිරීම හා සත්‍යාපනය (Data Verification) කිරීම.
- පුරවැසියන්ගේ තොරතුරු හා ජීව මිතික දත්ත හා ICAO ප්‍රමිතියට අනුව ලබාගත් ඡායාරූප ඇතුලත් පුරවැසි දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම.
- විද්‍යුත් ජාතික හැඳුනුම්පත නිකුත් කිරීම.
- තොරතුරු හුවමාරුකර ගැනීමේ හා තොරතුරු සත්‍යාපනය කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම.

## 3. සංශෝධිත ව්‍යාපෘති සැලැස්ම ක්‍රියාත්මක කිරීම

### 3.1 පසුබිම

තොරතුරු තාක්ෂණය භාවිතා කරමින් සියළුම රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන, තම සේවාවන් වඩාත් කාර්යක්ෂමව මහජනතාවට ලබා දිමේ ක්‍රියාවලියේදී පුද්ගල අනන්‍යතාව තහවුරු කර ගැනීම සඳහා පදනම් කරගනු ලබන මූලික ලියවිල්ල හැඳුනුම්පතයි. පුද්ගලයන්ගේ අනන්‍යතාවය තහවුරු කරනු ලබන ජාතික හැඳුනුම්පත, 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරිමේ පනත අනුව පුද්ගලයන් ලියාපදිංචි කිරිමේ දෙපාර්තමේන්තුව විසින් 1972 සිට මිනිස් ශ්‍රමය පමණක් භාවිතා කර නිකුත් කරනු ලබන ක්‍රමවේදය තුල හා නවින තාක්ෂණය අනුව සකස් නොවූ නිසාම ගැටළු රාශියක් පැන නැගි ඇත. ඒ හේතුවෙන් මහජනතාව, මහජන සේවා සපයන ආයතන හා මෙම දෙපාර්තමේන්තුවද මහත් අසිරුතාවයට පත්ව ඇත. එම නිසා රටේ ජාතික ආරක්ෂාව හා පුද්ගල ආරක්ෂාව තහවුරු කිරිමට අසිරු වි ඇත. තවද හැදුනුම්පත් සකස් කිරිමට භාවිතා කරනු ලබන යන්ත්‍ර සූත්‍ර යල්පැන ගොස් තිබිම හා ඒ සඳහා අවශ්‍ය අමතර කොටස් වෙළඳපොළෙන් සපයා ගැනිමට නොහැකි විම, හැඳුනුම්පත් සඳහා යොදා ගනු ලබන ආරක්ෂිත කාඩ්පත් වෙළඳපොළෙන් සපයා ගැනිම අපහසු විම නිසා හැඳුනුම්පත් නිකුත් කිරිමේ කාර්ය දෙපාර්තමේන්තුවට මහත් අසීරු කාර්යයක් වි ඇත.

පවතින හැඳුනුම්පතේ හා නිකුත් කරනු ලබන ක්‍රමවේදයෙහි ඇති ගැටළුවලට විසඳුමක් ලෙස පුරවැසියන් ලියාපදිංචි කිරිමට විද්‍යුත් දත්ත ගබඩාවක් සකස් කර ඒ මත විද්‍යුත් ජාතික හැඳුනුම්පතක් නිකුත් කිරිමේ ව්‍යාපෘතියට 2011.08.17 අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දි ඇත.

දැනට හැඳුනුම්පත් නිකුත් කිරිමේදි පුද්ගල අනන්‍යතාවය තහවුරු කර ගැනිම, ලේඛණ මත පමණක් පදනම් වි සිදු කරනු ලබන බැවින් එම කාර්ය නිවැරදිව සිදු නොවන බව තහවුරු වි ඇත. ජීවමිතික දත්ත ලෙස පුද්ගලයන්ගේ ඇඟිලි සළකුණු ලබා ගැනිමෙන් පුද්ගල අනන්‍යතාවය වඩාත් හොඳින් තහවුරු කර ගත හැකි හෙයින්, නව ක්‍රමවේදය අනුව අවුරුදු 15 වැඩි සියළුම ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ ජීවමිතික දත්ත ලෙස ඇඟිලි සළකුණු ඇතුලත්ව හා පුද්ගලයන්ගේ තොරතුරු සහ පවුලේ තොරතුරු සහ ජාත්‍යන්තර ප්‍රමිතියේ ඡායාරූපයක් ඇතුලත් ජාතික පුද්ගල නාම ලේඛණයක් ස්ථාපිත කර ඒ මත විද්‍යුත් ජාතික හැඳුනුම්පත් නිකුත් කිරිමට සැලසුම්කර ඇත.

ඒ අතර අවුරුදු 30ක් පුරා පැවති යුද්ධය 2009 ජූලි මස නිම වීමත් සමග සිංහල ජනතාවට හා දමිල ජනතාවට රටේ සෑම ප්‍රදේශයකටම ගමන් කිරිමට ඇති වූ අවස්ථාව සමග ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පුද්ගලයකු ඉදිරිපත් කරනු ලැබූ පෙත්සම අනුව පවතින හැඳුනුම්පත සිංහළ හා දෙමළ භාෂා දෙකෙන්ම නිකුත් කිරිමට නියෝග කර ඇත. පවතින ක්‍රමවේදය තුලින් භාෂා දෙකෙන් හැඳුනුම්පත් නිකුත් කිරිමේ හැකියාවක් නොමැති හෙයින්, විද්‍යුත් ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ ක්‍රමවේදය ස්ථාපිත වන තෙක් අන්තර්කාලින විසඳුමකට යා යුතු විය. ඒ අනුව විද්‍යුත් ජාතික හඳුනුම්පත් නිකුත් කිරිමේ ක්‍රියාවලියට පදනමක් ලෙස අන්තර්කාලීන විසඳුමක්, පවතින හැඳුනුම්පත නිකුත් කිරීමේ ක්‍රියාවලියට 2014 පෙබරවාරි 28 දින හඳුන්වා දි ඇත.

මේ අතර අවු. 15 වැඩි සියළු පුරවැසියන්ගේ ජීව දත්ත හා ජීවමිතික දත්ත ලෙස, ඇඟිලි සලකුණු ලබා ගැනිම සම්බන්ධ අවශ්‍ය සියළු කටයුතු සූදානම් කර ඇත. මේ සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරිමේ පනතට කරනු ලැබූ සංශෝධන සඳහා අනුමැතිය ලබා ගැනිමට සැලසුම් කල කාලයට වඩා වැඩි කාලයක් ගත වි ඇති බැවින්, දත්ත රැස් කිරිම ප්‍රමාද විය. සංශෝධන සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2015.04.01 දින ලැබි ඇති අතර එය පාර්ලිමේන්තු අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. පාර්ලිමේන්තු අනුමැතිය ලබා දුන් වහාම දත්ත රැස්කිරිම ආරම්භ කල හැක.

තවද, විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ක්‍රියාවලිය ස්ථාපිත කිරිම සඳහා වූ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ඇතිකිරිමේ ටෙන්ඩරය ප්‍රධානය කර ක්‍රියාත්මක කිරිමට සැලසුම් කරනු ලැබූ කාල සිමාවට වඩා දීර්ඝ

කාලයක් ගත වී ඇත. මෙම තත්වය අනුව විද්‍යුත් ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ කාර්ය කඩිනම් කිරීම සඳහා , ඒ සඳහා පදනමක් ලෙස හඳුන්වා දී ඇති, දැනටමත් ක්‍රියාත්මක, අන්තර් කාලීන විසඳුමට අවශ්‍ය වැඩි දියුණු කිරීම් සහිතව විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘති කටයුතු පියවරයන් කිහිපයක් යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජනා කරමු.

### 3.2 පළමු පියවර

### 3.2.1 පවතින හැඳුනුම්පත වෙනුවට ප්ලාස්ටික් කාඩ් පතක් නිකුත් කිරීම

දැනට භාවිතා කරනු ලබන සිංහල භාෂාවෙන් පමණක් අතින් ලිවීම සඳහා වූ මුද්‍රිත ආරක්ෂිත කාඩ්පත, භාෂා දෙකෙන් අන්තර් කාලීන විසඳුම් ක්‍රියාවලිය තුලින් නිකුත් කිරීම මහත් දුෂ්කර වී ඇති හෙයින්, විද්‍යුත් ජාතික හැඳුනුම්පත සඳහා නිර්මාණය කර ඇති තොරතුරු ඇතුලත් ප්ලාස්ටික් කාඩ්පතක් නිකුත් කිරීම.

අන්තර් කාලීන විසඳුම් ක්‍රියාවලිය සඳහා වූ මෘදුකාංගය, විද්‍යුත් ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ අවශ්‍යතා අනුව නිර්මාණය වී ඇති හෙයින්, ඒ තුලින් ප්ලාස්ටික් කාඩ් පතක් නිකුත් කිරීමේ හැකියාව ඇත. ඒ සඳහා මූලික වශයෙන් මුද්‍රණ යන්ත්‍ර 25ක් හා පෙරමුද්‍රිත ප්ලාස්ටික් කාඩ්පත් මිලියන 2 ක් මිලදී ගැනීමට සැලසුම් කර ඇත.

ප්ලාස්ටික් කාඩ්පතෙහි මුද්‍රිත ජාතික හැඳුනුම්පත 2016 පෙබරවාරි මාසයේ සිට නිකුත් කිරීමට කටයුතු කරනු ඇත.

### 3.2.2 දෙපාර්තමේන්තු ප්‍රාදේශීය කාර්යාල හරහා විද්‍යුත්ව අයදුම්පත් තොරතුරු ලබා ගැනීම

2007.06.06 දින අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, දෙපාර්තමේන්තු කාර්යයන් ප්‍රාදේශීය හා පළාත් මට්ටමට විමධ්‍යගත කිරීමට අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 331 හිම දෙපාර්තමේන්තු ඒකක පිහිටුවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට සංවර්ධන නිළධාරින් දෙදෙනකු බැගින් අනුයුක්ත කර ඇත.

නව හැඳුනුම්පතක් ලබා ගැනීමට, නැති වූ හැඳුනුම්පත වෙනුවට අනුපිටපත් ලබා ගැනීමට හා වෙනස් වූ තොරතුරු අනුව හැඳුනුම්පත වෙනස් කරගැනීමට අදාල සියළු අයදුම්පත්, දෙපාර්තමේන්තු ප්‍රාදේශීය කාර්යාලයන්ට ඉදිරිපත් කර එම තොරතුරු විද්‍යුත්ව ප්‍රධාන කාර්යාලයට ලබා ගැනීමට සැලසුම් කර ඇත. එය මහජනතාවට මහත් පහසුවක් වනු ඇත. මෙම ක්‍රමය ස්ථාපිත කිරීම සඳහා සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකටම පරිගණක යන්ත්‍ර දෙකක්, ලැප්ටොප් පරිගණකයක්, පරිලෝකණ යන්ත්‍ර (Scanner) දෙකක් හා මුද්‍රණ යන්ත්‍රයක් (Pinter) ලබා දීමට නියමිත වේ. ඒ සමගම තොරතුරු විද්‍යුත්ව ප්‍රධාන කාර්යාලයට ලබා දීම සඳහා සන්නිවේදන සම්බන්ධතා (Connectivity) පහසුකම් සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම ඇති කරනු ඇත.

### 3.2.3 අන්තර්කාලීන විසඳුම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිගණක යන්ත්‍ර සංඛ්‍යාව ස්ථාපිත කිරීම

විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ක්‍රියාවලියේ මූලිකාංග අනුව සැකසුනු අන්තර්කාලීන විසඳුම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට පරිගණක 75ක් මිල දී ගෙන ස්ථාපිත කිරීමට නියමිත වේ.

### 3.2.4. භෞතික යටිතල පහසුකම් ඇති කිරීම

විද්‍යුත් ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා මෙතෙක් ඉදි කර ඇති යටිතල පහසුකම් වලට අමතරව, පහත සඳහන් යටිතල පහසුකම් ඇති කිරීම ක්‍රියාත්මක කරමින් සිටී.

I. ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක තාවකාලික ලෙස පිහිටුවා ඇති දෙපාර්තමේන්තු ඒකක සඳහා ස්ථිර කාර්යාල පහසුකම් ඇති කිරීම.

II. ආපදා ප්‍රතිසාදන මධ්‍යස්ථානය පිහිටුවීමට අවශ්‍ය ගොඩනැගිල්ල ඉදි කිරීම .
හම්බන්තොට සූරියවැව තාක්ෂණික උද්‍යානයේ දැනට ඉදි කිරීම ආරම්භ කර ඇති ආපදා ප්‍රතිසාධන මධ්‍යස්ථානය නුවරඑළියට ගෙනයාමට වූ යෝජනාව සඳහා, අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන

නුවරඑළිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ පිහිටි පුද්ගලයන් ලියාපදිංචි කිරිමේ දෙපාර්තමේන්තුවට ලබා දි ඇති බිම් කොටසක එය ස්ථාපිත කිරීමට නියමිතය.

III. ප්‍රධාන දත්ත ගබඩාව ඉදිකිරිමට බත්තරමුල්ලෙහි පිහිටි පුද්ගල අනන්‍යතාවය පිළිබඳ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ අවශ්‍ය නවිකරණ කටයුතු සිදු කිරිම.

**3.2.5 පුරවැසියන්ගේ තොරතුරු රැස් කිරිම හා එම තොරතුරු විද්‍යුත්කරණය කිරිම**

i. **අවුරුදු 15 වැඩි පුරවැසියන්ගේ ජීව දත්ත හා ජීවමිතික දත්ත හා ICAO ප්‍රමිතියේ ඡායාරූපය සහිතව තොරතුරු රැස් කිරිම.**

දත්ත රැස් කිරිම පිළිබඳ ග්‍රාම නිලධාරි වසම් 14022ක ග්‍රාම නිලධාරින්, ප්‍රාදේශිය ලේකම් හෝ සහකාර ප්‍රාදේශිය ලේකම් පුහුණු කර ඇති අතර, අවශ්‍ය සියළු ද්‍රව්‍ය, උපකරණ හා උපදෙස් සෑම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයකටම ලබා දි ඇත. ඒ අනුව පුද්ගලයන් ලියාපදිංචි කිරිමේ පනතට කරනු ලැබු සංශෝධන සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගත් වහාම, සැලසුම් කර ඇති පරිදි අදාල තොරතුරු රැස් කිරිම හා මාස 06 ක් ඇතුලත එය නිම කිරිමට නියමිත වේ.

ii. **එකතු කරනු ලැබු තොරතුරු සැපයුම් කරුවකු මගින් විද්‍යුත්කරණය කිරිම**

මේ සඳහා ජාතික තරඟකාරි මිළගණන් කැඳවීමෙන් සැපයුම්කරුවකු තෝරාගෙන අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන, කොන්ත්‍රාත්තුව ප්‍රධානය කර ඇත. දත්ත රැස් කිරීම ආරම්භ කල වහාම, දත්ත විද්‍යුත්කරණය කිරිම ආරම්භ කල හැකි අතර, මාස 11 ක් ඇතුලත එය නිම කිරීමට සැලසුම් කර ඇත.

iii. **ජාතික පුද්ගල නාමලේඛණය ස්ථාපිත කිරීම**

දත්ත රැස්කිරිම හා දත්ත විද්‍යුත්කරණය කරගෙන යන අතරතුර, විද්‍යුත් කරණය කරන ලද පුද්ගලයන් මිලියනයක තොරතුරු මත, ජාතික පුද්ගල නාම ලේඛණය ආරම්භ කල හැක.

## 3.3. දෙවනපියවර - තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ඇති කිරිම

**3.3.1 අන්තර්කාලින විසඳුම් මෘදුකාංගය වැඩිදියුණු කිරිම**

සුදුසු සැපයුම් කරුවකු මගින් විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ක්‍රියාවලිය සඳහා අන්තර්කාලින විසඳුම් සඳහා වු මෘදුකාංගය, ජිව මිතික තොරතුරු, ඇඟිලි සලකුණු, පවුලේ තොරතුරු හා ICAO ප්‍රමිතියේ ඡායාරූපය ඇතුලත් කර නවිකරණය කිරිම.

**3.3.2 ප්‍රධාන දත්ත ගබඩාව හා ආපදා ප්‍රතිසාධන මධ්‍යස්ථානය ස්ථාපිත කිරිම**

සුදුසු සැපයුම්කරුවකු මගින් සර්වර්ස් (servers), UPS සහ අවශ්‍ය අනෙකුත් අමතර කොටස් සහිතව දත්ත මධ්‍යස්ථාන දෙක ස්ථාපිත කිරිම.

**3.3.3 දත්ත මධ්‍යස්ථාන දෙක සඳහා සන්නිවේදන සම්බන්ධතා ස්ථාපිත කිරිම**

**3.3.4 විද්‍යුත් ජාතික හැඳුනුම්පත් මෙහෙයුම් ඒකකය, අවශ්‍ය කාර්යාල උපකරණ හා ජාල සම්බන්ධතා සමග ස්ථාපිත කිරිම, සුදුසු සැපයුම් කරුවකු මගින් ඉටු කර ගැනිම**

## 3.4 තුන්වන පියවර

ජාතික පුද්ගල නාමලේඛණය පදනම් කරගෙන, නවින සංකේත සහිත විද්‍යුත් ජාතික හැඳුනුම්පත නිකුත් කිරිම හා තොරතුරු හුවමාරු කිරිමේ ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කිරිම.

## 4. ඇස්තමේන්තුව

යෝජනා කරනු ලැබු පියවරයන් අනුව රු. මිලියන 14500 ක ව්‍යාපෘති ඇස්තමේන්තුව රු. මිලියන 8000.7 ක් දක්වා අඩු කිරිමට හැකි වනු ඇත.

- ඉදිරි ව්‍යාපෘති කටයුතු සඳහා අවශ්‍ය වියදම් ඇස්තමේන්තුව රු මිලියන 7273.77
- මේ දක්වා වියදම රු මිලියන 726.94

ඇමුණුම :ඉදිරි ව්‍යාපෘති කටයුතු සඳහා අවශ්‍ය වියදම් ඇස්තමේන්තුව

| අනු අංකය | විස්තරය | මුදල (රුපියල් මිලියන) | එකතුව |
|---|---|---|---|
| | පළමු පියවර | | |
| 1 | පවතින හැඳුනුම්පත වෙනුවට මුද්‍රණය කරන ලද තොරතුරු හා ICAO ප්‍රමිතියේ ඡායාරූප සහිත හැඳුනුම්පත් නිකුත් කිරීම | 374.00 | |
| 2 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 331 හි පිහිටි දෙපාර්තමේන්තු ඒකක තොරතුරු විද්‍යුත්ව ලබා ගැනීමට අවශ්‍ය උපකරණ සමග ස්ථාපිත කිරීම | 397.02 | |
| 3 | භෞතික යටිතල පහසුකම් ඇති කිරීම | | |
| 3.1 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක තාවකාලිකව ස්ථාපිත කර ඇති දෙපාර්තමේන්තු ඒකකයන්හි ස්ථිර ඒකක ඇති කිරීම | 26.00 | |
| 3.2 | දෙපාර්තමේන්තුව ප්‍රාදේශීය කාර්යාල සඳහා සන්නිවේදන සම්බන්ධතා ලබා දීම | 19.93 | |
| 3.3 | ආපදා ප්‍රතිසාදන මධ්‍යස්ථානයේ ගොඩනැගිල්ල ඉදි කිරීම | 106.59 | |
| 3.4 | ප්‍රධාන දත්ත ගබඩාව, e-NIC මෙහෙයුම් ඒකකය, ව්‍යාපෘති කළමණාකරණ ඒකකය හා දෙපාර්තමේන්තුව නව ගොඩනැගිල්ලේ ස්ථාපිත කිරීම | 145.31 | |
| 4 | අවු.15 ට වැඩි සියළු පුරවැසියන්ගේ මූලික දත්ත රැස් කිරීම | 533.06 | |
| 5 | දත්ත විද්‍යුත්කරණය කිරීම | 715.80 | |
| | එකතුව | | **2317.17** |
| | දෙවන පියවර | | |
| 6 | අන්තර්කාලින විසඳුම් මෘදුකාංගය විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ක්‍රියාවලියේ අවශ්‍යතා අනුව වැඩි දියුණු කිරීම | 600.00 | |
| 7 | ප්‍රධාන දත්ත ගබඩාව, ආපදා ප්‍රතිසාදන දත්ත ගබඩාව ස්ථාපිත කිරීම | 762.00 | |
| 8 | e.NIC මෙහෙයුම් ඒකක ස්ථාපිත කිරීම | 145.17 | |
| | එකතුව | | **1507.17** |
| | තුන්වන පියවර | | |
| 9 | අමතර කාඩ් මුද්‍රණ යන්ත්‍ර | 126.4 | |
| 10 | ජාතික පුද්ගල නාම ලේඛණය ස්ථාපිත කිරීම හා විද්‍යුත් ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම | 2275.14 | |
| 11 | තොරතුරු හුවමාරු ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම | 5.00 | |
| | එකතුව | | **2406.54** |
| | **පියවරයන් තුනටම පොදු වියදම්** | | |
| 12 | තාක්ෂණික උපදේශන සේවාව | | 35.30 |
| 13 | දත්ත මධ්‍යස්ථාන, ප්‍රාදේශීය ඒකක, ප්‍රධාන කාර්යාල මෙහෙයුම් ඒකක සඳහා නඩත්තු වියදම් | | 640.41 |
| 14 | ව්‍යාපෘති කළමණාකරණය හා නියාමනය | | 177.59 |
| 15 | අවිනිශ්චිත වියදම් | | 189.59 |
| | **එකතුව** | | **7273.77** |

## 5. ව්‍යාපෘතියේ ප්‍රගතිය 2015.01.01 සිට 2015.12.31 දක්වා

| ක්‍රියාකාරකම් | වියදම් ඇස්තමේන්තුව (රු.මිලියන) | ප්‍රගතිය(රු.මිලියන) | | % |
|---|---|---|---|---|
| ව්‍යාපෘති කළමණාකරණය හා නියාමනය | 41.5 | මූල්‍ය | 14.1 | 34.2% |
| ව්‍යාපෘතිය සඳහා තාක්ෂණික උපදේශණ සේවාව ලබා ගැනීම. | 3.0 | මූල්‍ය | - | |
| | | භෞතික | • 2015.10.07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ලංකා ලොජිස්ටික් ඇන්ඩ් ටෙක්නොලොජීස් සමාගම මගින් ලබා ගන්නා ලද උපදේශණ සේවාව අවසන් කරන ලදී.<br>• තාක්ෂණික උපදේශන සේවාව සෘජුවම කොළඹ සහ මොරටුව විශ්ව විද්‍යාල වලින් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලදී. | |
| දත්ත එකතු කිරීමේ කටයුතු සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ශාඛා කාර්යාල මෙහෙයුම් මධ්‍යස්ථාන ලෙස ස්ථාපිත කිරීම සහ අවශ්‍ය කාර්යාල උපකරණ ලබාදීම | 24.5 | මූල්‍ය | 4.7 | 19.5% |
| | | භෞතික | • දත්ත රැස්කිරීම සඳහා සූදානම්කරන ලද පු. ලි. දෙ. ප්‍රාදේශීය කාර්යාල 331 න් 174 ක් නවීකරණය කිරීම.<br>• තාවකාලික ස්ථාන වල පැවති පු. ලි. දෙ. ප්‍රාදේශීය කාර්යාල 09 ක් සඳහා ස්ථිර ගොඩනැගිලි ඉදිකරන ලදී. | |
| විද්‍යුත් ජාතික හැඳුනුම්පත නිකුත් කිරීමට අදාලව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත සංශෝධනය කිරීම. | | මූල්‍ය | - | |
| | | භෞතික | • සංශෝධන සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2015.04.01 දින ලැබුණ අතර 2015.04.11 දින ගැසට් පත්‍රයේ පලකරන ලදී.<br>• සංශේධන පිළිබද පාර්ලිමේන්තු විවාදය 2015.07.07 දිනට ගැනීමට නියමිතව තිබූ නමුත් 2015.06.26 දින පාර්ලිමේන්තුව විසුරුවාහැරිය බැවින් පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීමට නොහැකි විය. එබැවින් නැවත අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී. | |
| ආපදා ප්‍රති සැකසුම් මධ්‍යස්ථානය ඉදිකිරීම ( Disaster Recovery Data Center) | 43.5 | මූල්‍ය | 0.028 | .07% |
| | | භෞක | • පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව අයත්ව තිබූ මහජන සාමය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ උපදෙස් අනුව හම්බන්තොට, සූරියවැව තාක්ෂණික උද්‍යානයේ ඉදිකිරීමට සැලසුම් කරනු ලැබූ ආපදා ප්‍රතිසැකසුම් මධ්‍යස්ථානය (DRC ) ඉදිකිරීම් නතර කිරීම.<br>• මෙම ආපදා ප්‍රතිසැකසුම් මධ්‍යස්ථානය (DRC ) දෙපාර්තමේන්තුවට අයත් නුවරඑළියේ පිහිටි බිම් කොටසක ඉදිකිරීම සඳහා වන අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත්කර ඇත. | |
| පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත සංශෝධනය කිරීම හා අවශ්‍ය රෙගුලාසි සකස් කිරීම හා අනුමැතිය ලබා ගැනීම. | | භෞතික | • ජාතික පුරවැසි දත්ත පද්ධතියක් සකස්කිරීම හා වි.ජා. හැ. නිකුත්කිරීමට අදාල පු. ලියාපදිංචි කිරීමේ පනත් සංශෝධන අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර ඇත. මේ සම්බන්ධව අමාත්‍ය මණ්ඩලය උප කමිටුවේ නිර්දේශ ඇතුලත්ව නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් සකස්කරන ලද අවසන් කෙටුම්පත අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබාගැනීමට අමාත්‍යාංශයට යොමුකර ඇත.<br>• අදාල රෙගුලාසි සකස්කර නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත | |

| ක්‍රියාකාරකම් | වියදම් ඇස්තමේන්තුව (රු.මිලියන) | ප්‍රගතිය(රු.මිලියන) | | % |
|---|---|---|---|---|
| පවතින හැඳුනුම්පත වෙනුවට නව ආකෘතියක ප්ලාස්ටික් කාඩ් පතක් නිකුත් කිරීම සඳහා නීතිමය ප්‍රතිපාදන සකස්කර ගැනීම. | | මූල්‍ය | - | |
| | | භෞතික | • මේ සඳහා වන රෙගුලාසි සකස්කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ගැසට් පත්‍ර යේ පල කිරීමෙන් අනතුරුව පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී. | |
| ICAO ප්‍රමිතියේ ඡායා රූප ලබාගැනීම සඳහා ඡයාරූප ශිල්පීන් ලියාපදිංචි කිරීම. | 0.25 | මූල්‍ය | - | |
| | | භෞතික | • කලින් අයදුම්පත් ඉදිරිපත් නොකල ඡායාරූප ශිල්පීන් සඳහා අවස්ථාව ලබා දීම සඳහා 2015.11.26 දින නැවත පුවත්පත් දැන්වීමක් පළකරන ලදී. ඒ අනුව මේවන විට අයදුම්පත් 1900 ක් පමණ ලැබී ඇත | |
| සියළුම ප්‍රාදේශීය හා පළාත් කාර්යාල වලින් ප්‍රධාන කාර්යාලයට තොරතුරු විද්‍යුත්ව ලබාගැනීම සඳහා VPN සබඳතාවය ලබාදීම. | 5.0 | මූල්‍ය | 0.048 | .98% |
| | | භෞතික | • ලංසුපත් කැඳවා ඇගයීම් කරඇත. | |
| සියළුම ප්‍රාදේශීය හා පළාත් කාර්යාල වලසිට අයදුම්පත්වල තොරතුරු විද්‍යුත්ව ලබා ගැනීමට හැකිවන පරිදි තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන උපකරණ ස්ථාපිත කිරීම (පරිගණක, මුද්‍රණ යන්ත්‍ර හා.පරිලෝකන යන්ත්‍ර) | 297.0 | මූල්‍ය | - | |
| | | භෞතික | • ලංසුපත් කැඳවා ඇගයීම් සිදු කර ඇත | |
| විද්‍යුත් ජාතික හැඳුනුම්පත නිකුත් කිරීමට අදාලව අන්තර් කාලීන විසඳුම් මෘදුකාංගය වැඩිදියුණු කිරීම. | | මූල්‍ය | - | |
| | | භෞතික | • ලංසු කැඳවීම සඳහා ටෙන්ඩර්පත් සකස්කර ඇත. | |

| ක්‍රියාකාරකම් | වියදම් ඇස්තමේන්තුව (රු.මිලියන) | ප්‍රගතිය (රු.මිලියන) | | % |
|---|---|---|---|---|
| විද්‍යුත් ජාතික හැඳුනුම්පත් මෙහෙයුම් ඒකකය බත්තරමුල්ල පුද්ගල අනන්‍යතාවය පිළිබඳ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලෙහි ස්ථාපිත කිරීම. | 112.0 | මූල්‍ය | - | |
| | | භෞතික | • බෙදාවෙන්කිරීම්, ජාලකරණය හා විදුලි සැපයීමට අදාලව ලංසුපත් කැඳවා ඇත. | |
| දත්ත රැස්කිරීමේ නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම. | | මූල්‍ය | - | |
| | | | • දකුණු පළාතේ තෝරාගනු ලැබූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 27 ක නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබූ අතර අයදුම්පත් එක් ලක්ෂ අනූදාහක් පමණ ලැබී ඇත. | |
| දෙපාර්තමේන්තු කාර්යය මණ්ඩලය දැනුවත් කිරීම. | 1.4 | මූල්‍ය | 0.067 | 4.8% |
| | | භෞතික | සංශෝධිත ව්‍යාපෘති සැලැස්ම අනුව දෙපාර්තමේන්තු කාර්යය භාරය පිළිබඳව මාණ්ඩලික නිලධාරීන් හා අංශ ප්‍රධානීන් දැනුවත් කිරීම. | |

**පසුගිය වසර තුල ව්‍යාපෘතියේ ප්‍රගතියට බලපෑ ගැටළු**

**පහත සඳහන් ප්‍රධාන ගැටළු 2015 වසර තුල සැලසුම් කල කාර්යයන් හි ප්‍රගතිය ලබාගැනීමට බලපා ඇත**

1. 2011.08.17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ලංකා ලොජිස්ටික් ඇන්ඩ් ටෙක්නොලොජීස් සමාගම ව්‍යාපෘති කළමණාකරු ලෙස කටයුතු කලත්, විද්‍යුත් ජාතික හැඳුනුම්පත් නිකුත් කිරිමට අදාලව 1968 අංක 32 දරණ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතට සිදුකලයුතු සංශෝධන සහ රෙගුලාසි සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් එම කාර්යය ව්‍යාපෘතියට කිරීමට සිදුවීම හේතුවෙන් ඒ සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීම මේ දක්වා ප්‍රමාද වීම.

2. වසර 3ක, ව්‍යාපෘති කාලසීමාව 2015 ජුලි මස අවසන් වූයෙන්, ව්‍යාපෘති කාර්යයන් කඩිනම් කිරීමට සංශෝධනය කරනු ලැබූ ව්‍යාපෘති සැලැස්මට හා ව්‍යාපෘති කාලසීමාව දීර්ඝ කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට හැකිවූයේ 2015.10.07 දිනය.

3. ආපදා ප්‍රතිසාධන මධ්‍යස්ථානය ඉදිකිරීම, සූරියවැව, තාක්ෂණික උද්‍යානයේ ඉදිකිරීමට කලින් සැලසුම් කලද, අවශ්‍ය යටිතල පහසුකම් ප්‍රමාණවත් පරිදි නොමැතිවීම හේතුවෙන් මේ සම්බන්ධව, මහජන සාමය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමා මගින් පත් කරනු ලැබූ කමිටුවේ නිර්දේශ අනුව, ආපදා ප්‍රතිසාධන මධ්‍යස්ථානය, නුවරඑළිය පිහිටි දෙපාර්තමේන්තු ඉඩමක ස්ථාපිත කිරීමට නිර්දේශ කර ඇත. ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශය 2015.10.13 දින අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇති අතර අනුමැතිය ලබා ගැනීමට නියමිත වේ.

4. මිලියන 15 වැඩි ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ තොරතුරු, ජීවමිතික දත්ත විද්‍යුත්කරණය(Data Digitizing) සඳහා සැපයුම්කරුවකු තෝරාගෙන කොන්ත්‍රාත්තුව පිරිනමා සූදානම් කර ඇත. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පණතට අදාල සංශෝධන සඳහා පාර්ලිමේන්තුවේ අනුමතිය ලබා ගන්නා තෙක් මෙම ටෙන්ඩරය ක්‍රියාත්මක කිරීම පමාවී ඇති අතර, අනුමැතිය ලද වහාම දත්ත එකතු කිරීමට හා විද්‍යුත්කරණය කිරීමට අවශ්‍ය සියළු කටයුතු සූදානම් කර ඇත.

5. 2015 වර්ෂය තුල දෙපාර්තමේන්තුව අමාත්‍යාංශ 04 කට මාරුවීම හේතුවෙන් සැලසුම්කල පරිදි ව්‍යාපෘති කටයුතු අඛණ්ඩව සිදුකිරීමට නොහැකි වීම.

ඇමුණුම් I

## පුහුණු වැඩසටහන් ප්‍රගතිය (2015.01.01 සිට 2015.12.31 දක්වා)

| | පුහුණු පාඨමාලාව | වියදම (රු.) | ප්‍රගතිය (සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව) |
|---|---|---|---|
| 1. | රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව | 205,500.00 | 2 |
| 2. | දෙමළ භාෂා පුහුණු පාඨමාලාව | 630,300.00 | 91 |
| 3. | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් පිළිබඳ පුහුණු වැඩමුළුව | 8,500.00 | 1 |
| 4. | නායකත්වය හා කණ්ඩායම් ගොඩනැගීම පිළිබඳ පුහුණුව | 12,000.00 | 2 |
| 5. | ලේකම්කරණ කුසලතා වර්ධනය පිළිබඳ පුහුණු වැඩමුළුව | 6,000.00 | 1 |
| 6. | සිංහල භාෂා පුහුණුව | 4,000.00 | 4 |
| 7. | දෙපාර්තමේන්තු පරිගණක පද්ධතිය නඩත්තුව හා වැඩිදියුණු කිරීම සඳහා සැපයුම්කරුවකු තෝරා ගැනීම සඳහා පිරිවිතර සැකසීම පිළිබඳ පුහුණු වැඩමුළුව | 11,073.00 | 5 |
| 8. | නවක සහකාර කොමසාරිස්වරුන් සඳහා සේවාරම්භක පුහුණුව | 3,080.00 | 6 |
| 9. | සේවක අභිප්‍රේරණ පුහුණු වැඩමුළුව | 280,505.00 | 320 |
| 10. | මානව සම්පත් කළමනාකරණය | - | 9 |
| 11. | ඵලදායිතාවය හා ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම පිණිස ධනාත්මක ආකල්ප වර්ධනය | - | 4 |
| 12. | ව්‍යාපාරික ලිපි රචනා කිරීම | - | 8 |
| 13. | සම්පත් භාවිතය හා සුරක්ෂිත ජාලකරණය | - | 2 |
| 14. | සමාන්තර චින්තනය | - | 2 |
| 15. | වැටුප් පරිවර්තනය | - | 8 |
| 16. | කාර්යාල සේවක සේවයේ කාර්යාභිවර්ධනය | - | 1 |
| 17. | ආපදා කළමනාකරණය | - | 4 |
| 18. | රජයේ විගණන කටයුතු | - | 17 |
| 19. | සේවාලාභී සත්කාරය හා මහජන සම්බන්ධතාවය | - | 5 |
| 20. | භාණ්ඩාගාර ප්‍රතිපාදන කළමනාකරණය | - | 5 |
| 21. | රජයේ ගිණුම් පටිපාටිය | - | 61 |
| 22. | රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය | - | 3 |
| 23. | කාර්යාල කළමනාකරණය හා ආකල්ප වර්ධනය | - | 15 |
| 24. | පරිසර කළමනාකරණය | - | 1 |
| 25. | සන්නිවේදනය හා ඉදිරිපත් කිරීමේ කුසලතාවය | - | 4 |
| 26. | රාජ්‍ය සේවයේ ආකල්ප වර්ධනය | - | 2 |
| 27. | රාජය මූල්‍ය කළමනාකරණය | - | 32 |
| 28. | රජයේ නිලධාරීන් දැනුවත් වියයුතු නීති | - | 34 |
| 29. | රජයේ ගෙවීම් පටිපාටිය | - | 18 |
| 30. | ව්‍යාපෘති කළමනාකරණය | - | 9 |
| 31. | ගබඩා කළමනාකරණය | - | 5 |
| 32. | විශ්‍රාම වැටුප් කටයුතු | - | 4 |
| 33. | ආයතන සංග්‍රහයේ විධිවිධාන හා කාර්යා පටිපාටික රීති | - | 23 |
| 34. | විනය කාර්ය පටිපාටිය | - | 15 |
| 35. | ඉ රාජ්‍ය යෙදවීම හා ආරක්ෂාව | - | 4 |
| 36. | වෘත්තිය හා ජීවිතය සමබර කර ගැනීම සඳහා භාවාත්මක බුද්ධිය | - | 20 |
| | **එකතුව** | **1,160,958.00** | **747** |
| | නිෂ්පාදන සහායක නිළධාරින් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය පැවැත්වීම | 33,282.50 | 13 |
| | **මුළු එකතුව** | **1,194,240.50** | **760** |

ඇමුණුම් II

## 2015.01.01 සිට 2015.12.31 දක්වා හැඳුනුම්පත් සම්බන්ධයෙන් කෙරුණු නීතිමය ප්‍රගතිය

| අංකය | ක්‍රියාකාරකම | ලද අයදුම්පත්/ ලිපි | ක්‍රියාකාරි අයදුම්පත්/ ලිපි | වැඩ අවසන් අයදුම්පත් /ලිපි |
|---|---|---|---|---|
| 01 | ගැටලු සහිත අයදුම්පත්<br>i. එකම හැඳුනුම්පත් අංකයට එකිනෙකට වෙනස් පුද්ගලයන් දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනකට පරිගණක වාර්තා/සුචි හෝ අංක වාර්තා තිබීම<br>ii. මුල් අයදුම්පත් දෙකක් ඉදිරිපත් කර ඇති නම් එවැනි අවස්ථාවල (ද්විත්ව අයදුම්පත් ඉදිරිපත් කිරීම)<br>iii. සංශෝධිත අයදුම්පත් සමඟ විකෘතිකරන ලද හැඳුනුම්පත් හා වෙනත් පුද්ගලයන්ට හිමි හැඳුනුම්පත් ඉදිරිපත් කිරීම<br>iv. හැඳුනුම්පත් අංක දෙකක් යටතේ හැඳුනුම්පත් ලබාගෙන තිබීම<br>v. ප්‍රදේශීය ලේකම්ගේ අනු අත්සන සැකසහිත අයදුම්පත්<br>vi. අයදුම්පත් සමඟ යොමුකෙරෙන සැකකටයුතු උප්පැන්න සහතික පරීක්ෂා කිරීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්මේන්තුවට යොමුකිරීම<br>vii. පැරණි අංක ලේඛනවල පැවති අඩුපාඩු<br>a) එකම හැඳුනුම්පත් අංකය දෙතැනක සටහන් වීම<br>b) වැරදි හැඳුනුම්පත් අංක සටහන් වීම<br>c) කාර්ය මණ්ඩලය විසින් හැඳුනුම්පත් අංක නිසිලෙස සටහන් නොකිරීම මත සිදුවන වැරදි<br>viii. ව්‍යාජ උප්පැන්න සහතික ඉදිරිපත් කිරීමට අදාල නීතිමය ක්‍රියාමාර්ග ගැනීම | 7319 | 4010 | 3309 |
| 02 | I. විදේශගත වී සිටින හෝ විදේශගත වීමට බලාපොරොත්තු අයට අවශ්‍ය පොලිස් නිෂ්කාශන සඳහා හැඳුනුම්පත් අංක තහවුරු කිරීම | 14858 | 260 | 14598 |
| | II. හැඳුනුම්පත් අංක තහවුරු කිරීම් - ලිපි | 192 | - | 192 |

| අංකය | ක්‍රියාකාරකම | ලද අයදුම්පත්/ ලිපි | ක්‍රියාකාරි අයදුම්පත්/ ලිපි | වැඩ අවසන් අයදුම්පත් /ලිපි |
|---|---|---|---|---|
| 03 | හැඳුනුම්පත් අංක තහවුරු කිරීම් | | | |
| | i. හැඳුනුම්පත් අංකය තහවුරු කිරීමේ මහජන ඉල්ලීම් | 11974 | 1170 | 10804 |
| | ii. ආරක්ෂක අංශ සඳහා (පොලිසි, ජනාධිපති විමර්ෂණ ඒකකය, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට | 1794 | 103 | 1691 |
| | iii. රාජ්‍ය හා පෞද්ගලික ආයතන සඳහා (රාජ්‍ය හා පෞද්ගලික බැංකු, කම්කරු දෙපාර්තමේන්තුව, අර්ථසාධක අරමුදල, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, මැතිවරණ දෙපාර්තමේන්තුව) | 1873 | 184 | 1689 |
| | iv. විදේශීය නියෝජිත ආයතන සඳහා | | | |
| | a. IOM, තානාපති කාර්යාල, මහ කොමසාරිස් කාර්යාල | 34 | 2 | 32 |
| | v. අධිකරණ කටයුතු සඳහා කරනු ලබන හැඳුනුම්පත් විමසීම | 153 | 13 | 140 |
| 04 | ව්‍යාජ ලේඛන ඉදිරිපත් කර හැඳුනුම්පත් සකස් කිරීමට අදාල අයදුම්පත් පිළිබඳව විධිමත් පරීක්ෂණ සිදුකිරීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමුකිරීම | 15 | 15 | |

ඇමුණුම් **III**

**කාර්ය මණ්ඩල විස්තර - 2015.12.31 දිනට**

**සේවක සංඛ්‍යා පිළිබඳ විස්තර වාර්තාව (කාර්ය මණ්ඩලය)**

| තනතුරු නාමය | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්තය |
|---|---|---|---|---|
| කොමසාරිස් ජනරාල් | 1 | 1 | - | - |
| අතිරේක කොමසාරිස් ජනරාල් | 1 | 1 | - | - |
| කොමසාරිස් | 3 | 3 | - | - |
| ප්‍රධාන ගණකාධිකාරී | 1 | 1 | - | - |
| නියෝජ්‍ය/ සහකාර කොමසාරිස් | 16 | 16 | - | - |
| නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ | 1 | - | 1 | - |
| ගණකාධිකාරී | 1 | 1 | - | - |
| අභ්‍යන්තර විගණක | 1 | 1 | - | - |
| පරිපාලන නිලධාරී | 2 | 2 | - | - |
| භාෂා පරිවර්තක | 2 | - | 2 | - |
| අයවැය සහකාර (ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් අනුයුක්ත කිරීම සඳහා) | 1 | 1 | - | - |
| බලාත්මක නිලධාරී | 75 | 67 | 8 | - |
| සංවර්ධන නිලධාරී | 827 | 777 | 50 | - |
| කළමනාකරණ සහකාර | 282 | 174 | 108 | - |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 10 | 8 | 2 | - |
| රියදුරු | 11 | 8 | 3 | - |
| කාර්යාල කාර්ය සහායක | 85 | 73 | 12 | - |
| නිෂ්පාදන සහායක * | 36 | 36 | - | - |
| ලේඛන සහායක * | 10 | 10 | - | - |
| | **1366** | **1180** | **186** | **-** |

*** මෙම තනතුරු දරන්නාට පුද්ගලික වනසේ නිර්දේශ කර ඇති අතර, මෙම තනතුරු අහෝසි වීමෙන් ඇතිවන පුරප්පාඩු සඳහා කාර්යාල කාර්ය සහායක තනතුරු සංඛ්‍යාව 131 ක් විය යුතුය.**